www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් රාජධානියේ යුද්ධය නතර කරනු සභාගය, ලේබර් පක්ෂයේ සේවයට කැපවූ ව්‍යාජ යුද විරෝධී ව්‍යාපාරයකි

## UK’s Stop the War Coalition: A bogus antiwar movement in the service of the Labour Party

**රොබට් ස්ටීවන්ස්**
**2015 නොවැම්බර් 30**

පසුගිය 28 දා, යුද්ධය නතර කරනු සභාගය, ලන්ඩන් නුවර ඩවුනිං වීදියේ අංක 10 බ්‍රිතාන්‍ය අගමැතිගේ නිල නිවස ඉදිරිපිට විරෝධතාවක් පැවැත්වූහ.

උද්ඝෝෂනයේ කේන්ද්‍රීය අරමුන වූයේ, පසුගිය වසර 15 තිස්සේ විවිධ අධිරාජ්‍යවාදී යුද්ධ සඳහා හුදු “වැරදීමක්” නිසා තම සහාය ලබාදී ඇතැයි කියා සිටි ජෙරමි කෝබින්ට සහ ලේබර් (කම්කරු) පක්ෂයට සහාය දීමේ අව්‍යාජ අන්තරයට, යුද විරෝධී මනෝ ගතිය හරවා යැවීමයි. මෙම ඉදිරි දර්ශනයේ බංකොලොත්කම නිසාම සහභාගීත්වය 5,000 කටත් වඩා අඩු විය.

ඉදිරිපත්වූ එකම යෝජනාව වූයේ ඇෆ්ගනිස්ථාන ඉරාක යුද්ධ ප්‍රතිඵල වලින් “පාඩම් ඉගෙන ගැනීම” සඳහා යුද්ධයට පක්ෂ ලේබර් මන්ත්‍රීන්ට බලපෑම් කිරීමයි.

ඔවුන් රටපුරා නගර ගනනාවක රැලි පැවැත්වූ අතර සියයක් පමන සහභාගී වූ ලීඩ්ස්, ෂෙෆීල්ඩ් හා මැන්චෙස්ටර් පෙලපාලි සේම ඒවා දුර්වල තත්වයක පැවතුනි.

එම විරෝධතා ව්‍යාපාරය නිර්ව්‍යාජ යුද විරෝධී ව්‍යාපාරයක් නොව, බ්‍රිතාන්‍ය පාලක ප්‍රභූව උදෙසා වඩාත් සංගත මූලෝපායික ප්‍රතිපත්ති වර්ධනය කිරීම උනන්දු කරලීම අරමුනු කරගත් බලපෑම් කිරීමේ කන්ඩායමකි. එය 2007 දී “ඇමරිකා එක්සත් ජනපද පරිපාලනයෙන් ස්වාධීනවූ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලෙස” එවක ලේබර් ආන්ඩුවට කැඳවුම් කරන ප්‍රකාශනයක් නිකුත් කලේය.

2013 දී, සිරියාවේ බ්‍රිතාන්‍ය මිලිටරි කටයුතු නතර කිරීම සඳහා කැරලිකාර ටෝරි (කොන්සර්වටිව් පක්ෂ) මන්ත්‍රීන් 30 දෙනෙකු සමග ලේබර් මන්ත්‍රීන් සන්ධාන වීමෙන් පසු, සමාජවාදී කම්කරු පක්ෂයේ හිටපු සාමාජික හා 2010න් පසු කවුන්ටර්ෆයර් නමින් එම පක්ෂයෙන් බිඳුනු කන්ඩායමේ නායකයා වූ මෙම ව්‍යාපාරයේ නායක ලින්ඩ්සි ජර්මන් ප්‍රකාශකල පරිදි, “අවුරුදු ගනනාවක් තිස්සේ අප කීවා බ්‍රිතාන්‍යය ඇමරිකාවේ විදේශ ප්‍රතිපත්තිය පියවරක් පාසා අනුගමනය කිරීමෙන් බිඳ ගැනීම අපගේ ව්‍යාපාරයේ එක් අරමුනක් කියා”. “මේ සතියේ අපි එම හැකියාව ඇති කලෙමු”.

සිරියාවේ මිලිටරි මෙහෙයුම් සඳහා සිය හේතු කාරනා කැටි කරමින් නොවැම්බර් මස 29 වන දින කැමරන් පාර්ලිමේන්තුවට කල ප්‍රකාශය, කරුනු 7ක් යටතේ ප්‍රතික්ෂේප කරන ප්‍රකාශයක් ඔවුන් ලන්ඩන් විරෝධතාවයට පෙරාතුව පල කලේය. එහි ආරම්භක වාක්‍යයෙන් ප්‍රකාශ කලේ “අයිසිස් යන ඉස්ලාමීය මූලධර්මවාදී සංවිධානය පරාජය කිරීම සඳහා සංගත මූලෝපායක සටහනක්” කැමරන් සම්පාදනය නොකල බවත්, “බ්‍රිතාන්‍ය බෝම්බ ප්‍රහාර, ඊට වඩා බෙහෙවින් විශාල ඇමරිකානු හමුදාවන් හා ඔවුන්ගේ සහකරුවන් පසුගිය මාස 13 තිස්සේ අත්කර ගත්තාට වඩා වැඩියෙන් ඵලදායක වන්නේ කෙසේද කියා පැහදිලි කිරීමට ඔහු අසමත් වූ බවත් ය.”

මීට විපරිතව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය, ඇමරිකාව සමග බලය “මාරු කිරීමේ හා ගනු දෙනු සාකච්ඡාවල” නිරත විය යුතුය. තව දුරටත් එය සඳහන් කරන පරිදි, හමුදා මෙහෙයුම් දැනට කෙරෙන ගනු දෙනු සාකච්ඡා ඉක්මන් කරනු වෙනුවට, ඒවා සංකීර්න කර බාධා කරයි. සිවිල් යුද්ධයේ වියවුල් ස්වභාවය අයිසිස් තර කිරීමේ කොන්දේසි සම්පාදනය කරයි. එය සමග පොර බැදීම සඳහා එම ප්‍රදේශයේ ජනතාවන්ට දේශපාලන විසඳුමක් අවශ්‍යය.

ඔවුන් කැමරන්ට දෙන අවසන් සුහද අවවාදය නම් “බෝම්බ දැමීම තිබෙන එකම විදේශ ප්‍රතිපත්තිය නොවේ” සහ “බ්‍රිතාන්‍යය සහ ඇමරිකාව සාම සාකච්ඡා වලට බාධා කරනු වෙනුවට ඒවා දිරිමත් කිරීම වැදගත්ය.”

ධනපති පන්තියේ සැලකිය යුතු කොටසකගේ ස්ථාවරයෙන් එම විරෝධතා ව්‍යාපාරයේ ස්ථාවරය වෙන්කොට හඳුනාගත නොහැකි තරම්ය. අයිසිස් පරාජය කිරීම සඳහා වන හොඳම ක්‍රමය ලෙස රුසියාව හා බෂර් අල් -අසාද්ගේ රෙජීමය අතර සන්ධානයකට සහයෝගය දැක්වීම සඳහා ටෝරීන් උනන්දු කරවීමට එය සමාන වනු ඇත. එ නමුත් එවන් සන්ධානයක ස්වභාවය තාවකාලික වනවා පමනක් නොව එය වෙනස් බලවේග කාන්ඩ ගැසීමක් යටතේ ප්‍රදේශයේ මිලිටරි මැදිහත් වීමකට පාර කපනු ඇත්තේ “ප්‍රගතිශීලී” සහ අපක්ෂපාතී ලෙස පෙනී සිටීමේ අමතර වාසියද සහිතවය.

සිරියාවේ බ්‍රිතාන්‍ය ගුවන් ප්‍රහාර වලට විරුද්ධව ලේබර් පක්ෂ නායක ජෙරමි කෝබින් කල ප්‍රකාශය සඳහා සෑම කථිකයෙක්ම ඔහුට ප්‍රශංසා කලේය. සිරියාවට බෝම්බ දැමීම පිලිබඳ ඡන්දයක් පැවැත්වීමට දින කිහිපයකට පෙරාතුව පැවැත්වෙන උද්ඝෝෂනයකට ඔහු නොපැමිනීම, පැමින සිටි අය බොහෝ දෙනෙකු ව්‍යාකූල කල බවට සැකයක් නැත. 2013 අගෝස්තු මස සිරියාවේ මිලිටරි මෙහෙයුම් ප්‍රතික්ෂේප කිරීමට තුඩු දුන් පාර්ලිමේන්තු ඡන්දයට පෙර දිනවල ඩවුනිං වීදියේම පිටත පැවැත්වූ උද්ඝෝෂනයේ ප්‍රධාන කථිකයන් අතර ජෙරමි කෝබින් ද විය. ඔහු එම ව්‍යාපාරයේ ආරම්භක සාමාජිකයෙකු මෙන්ම 2011 සිට 2015 දක්වා එහි සභාපති ද විය.

කෙසේ වෙතත් පක්ෂයේ දක්ෂිනාංශය අස්වැසීම සඳහා ඔහු නායකත්වයට පත්වීමෙන් පසු ඉක්මනින්ම එම ව්‍යාපාරයේ රැස්වීමක් ඇමතීම සඳහා වූ සැලැසුම් අවලංගු කල අතර, එහි සභාපති තනතුරෙන් ද ඉල්ලා අස්විය. යුද්ධයට පක්ෂ පාර්ලිමේන්තු ලේබර් පක්ෂ බහුතරය පක්ෂ නායක කමින් ඔහු ඉවත් කිරීමට එලිපිටම උද්ඝෝෂනය කරත් දී ත් ඔවුනට මුහුන දීම ඔහු ප්‍රතික්ෂේප කර ඇත.

එහි සභාපති ද, ස්ටැලින්වාදී බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේ පුමුඛ සාමාජිකයෙකු ද වන ඇන්ඩෘ මරේ, ප්‍රථම කථිකයා ලෙස රැලියේ තානය සැකසූ අතර "ජෙරමි කෝබින් පසුපස පෙලගැසෙනු" කියා ලේබර් මන්ත්‍රීන්ට පැවසීම පිනිස "අප දස දහස් හා සිය දහස් ගනනින්" පෙල ගැසිය යුතුය.

සමාජවාදී කම්කරු පක්ෂයේ තවත් හිටපු නායකයකු ද දැන් කවුන්ටර්ෆයර්හි ජෝන් රීස්, හුදෙක් ලේබර් පක්ෂය පමනක් නොව, ස්කොට්ලන්ත ජාතික පක්ෂයට ද හරිත පක්ෂයට ද ඇරයුම් කලේය. "මෙම (සිරියාවට) බෝම්බ හෙලීමට ස්කොට්ලන්ත ජාතික පක්ෂය විරුද්ධයි, අපි ඔවුන්ට සුභ පතනවා" ඔහු ප්‍රකාශ කලේය. "හරිත පක්ෂය මෙම බෝම්බ හෙලීමට විරුද්ධයි, අපි ඔවුන්ට සුභ පතනවා, ලේබර් පක්ෂයේ ප්‍රතිපත්තිය මෙම බෝම්බ හෙලීමට විරුද්ධවීම යි, අපි ඔවුන්ට සුභ පතනවා."

"මුලු ලේබර් පක්ෂයම එහි නායකයා පසුපස පෙල ගැසිය යුතුයි", යුද්ධයට පක්ෂ ඡායා විදේශ ලේකම් හිලරි බෙන්ට් ඉරාක යුද්ධයේ "පාඩම ඉගෙන ගැනීමට" උනන්දු කරවමින් වැඩිදුරටත් ඔහු පවසා සිටියේය. "එදත් ඔබ වැරදියි, දැනුත් ඔබ වැරදියි."

ලේබර් මන්ත්‍රීන් "දන්නවා ඔබලා ටෝරි පක්ෂයට සහයෝගය දීලා ස්කොට්ලන්තයේ වුනු දේ [මැයි මස මහ මැතිවරනයේදී ලද මහත් පරාජය] නැවතත් පක්ෂය මඩ ගොහොරුවට ඇදගෙන යෑමේ වැරද්ද කරන්න එපා."

ඔහු ලේබර් යුදවාදීන්ට අවවාද කරමින් "ඔබට විරුද්ධ පක්ෂය වීමට අවශ්‍ය නම්, ඔබට ජීවිත බේරා ගැනීමට අවශ්‍ය නම්, ඔබට යුද්ධය නතර කිරීමට අවශ්‍ය නම්, යුද විරෝධී ව්‍යාපාරය සමග පෙනී සිටිමින් සටන් කිරීමට පටන් ගන්න."

අධිරාජ්‍යවාදයට පක්ෂපාතී ස්ථාවරයක් පෙරට ගැනීමෙහි ලා ගාඩියන් මාධ්‍යවේදී ඕවන් ජෝන්ස් වඩාත්ම විවෘතව ඉදිරිපත් විය. ප්‍රදේශයේ භූ මූලෝපායාත්මක උත්සුකතාවයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඇමරිකාවේ හා බ්‍රිතාන්‍යයේ ප්‍රධාන එල්ලය වූ -අසාද් ඉවත් කිරීම සඳහා ඔහු තම අනුමැතිය ප්‍රකාශ කලේය.

ඔහු ඉස්ලාමීය රාජ්‍යය (අයිසිස්) ගැන කියමින්, "මේ සංවිධානය පොලෝ තලයෙන් අතුගා දමන දිනය හොඳ දිනයක් වේ. අප ඒ දිනය සඳහා වැඩ කරමු. අප සැවොම ඒ ගැන එකඟයි. එතැනට ලංවෙන විදිය තමා ප්‍රශ්නය."

ජෝන්ස් තව දුරටත් "සිරියාවේ ඝාතනයට ලක්වන අති මහත් බහුතරය ඝාතනයට ලක් වන්නේ අයිසිස් අතින් නොවේ. ඔවුන් ඝාතනය කරනු ලබන්නේ [අසාද්ගේ] ඒකාධිපතිත්වය මගිනි.

"ජාතික එක්සත් ආන්ඩුවක් මෙයට ඇති එකම විසඳුමයි, කල් පවත්නා විසඳුමයි. ඉතින් අපි එම විසඳුම සඳහා පෙනී සිටිමු. මීට සම්බන්ධ ප්‍රදේශයේ සියලු කොටස් එක්තැන් කිරීම මගින් එය සහතික කරන" යනුවෙන් ඔහු සඳහන් කලේය.

ධනපති විචාරකයෙකු සහ හිටපු ප්‍රමුඛ පැබ්ලෝවාදියෙකු වූ තරික් අලි, ස්කොට්ලන්ත ජාතික පෙරමුන හා හරිතයන් ද "හොඳම ලේබර් වරුන්ද" යුද්ධයට විරුද්ධවීම හේතුවෙන් පැසසුමට ලක් කලේය. "අධිරාජ්‍යවාදය සම්බන්ධයෙන් සැලකූ කල පක්ෂයට ලැබුන වඩාත්ම වාමාංශික නායකයා" කෝබින් යයි ඔහු පැවසීය. "යුද්ධය සඳහා පෙර කල ලේබර් පක්ෂය සහයෝගය දක්වා තිබියදීම අධිරාජ්‍යවාදයට තිරසාරව විරුද්ධ සම්ප්‍රදායක් කම්කරු ව්‍යාපාරය තුල තිබේ. අපි අධිරාජ්‍යවාදයට තිරසාරව විරුද්ධ (ඒ) ප්‍රවාහය සමග සිටින්නෙමු." "සිරියාවට බෝම්බ නොහෙලනු" යයි කැමරන්ට හා ලේබර් පක්ෂයේ ඔහුගේ මිතුරන්ට දැඩි ආයාචනයක්" සඳහා කැඳවුම් කරමින් ඔහු තම කථාව අවසන් කලේය.

රැලියේ කථිකයෙකු නොවුවද, යුද විරෝධී ව්‍යාපාරයේ කැපී පෙනෙන ආධාර කරුවෙකු මෙන්ම කෝබින් සගයෙකු ද වන කෙන් ලිවිංස්ටන්, ගොඩබිම් සේනා සිරියාවට යැවීමට - ඉරාකයෙන් හා ඇෆ්ගනිස්ථානයෙන් පසු වඩාත් අපකීර්තියට ලක්වූ, බ්‍රිතාන්‍ය භටයන් නොව - පක්ෂව ප්‍රකාශයක් නොවැම්බර් අවසන් සති අන්තයේ නිකුත් කලේය.

කෝබින් විසින් ලේබර් පක්ෂයේ ආරක්ෂක ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමේ සම සභාපතිත්වය පිරිනැමූ ලිවිංස්ටන්, ඒ වෙනුවට උපදෙස් දුන්නේ, "අපි චීනය වැනි රටවල් දෙස නෙත් යොමු කල යුතුයි. ලෝක වේදිකාව මතට ඔවුන් ගෙන එන එවන් අවස්ථාවක් චීනය පෙරට පැන පිලිගනු ඇත. ඔවුන්ට මිලියන සංඛ්‍යාත හමුදාවන් ඇත."

© www.wsws.org